# 2.14 යුද්ධයේදී ආබාධිත වන සෙබලුන්ගේ බිරියන් මුහුණ දෙන මනෝ, සමාජීය ගැටලු (වතුපිටිවල රණවිරු ගම්මානය ඇසුරින්)

එච්.ඒ. කුමුදු සුමේධා සංජීවනී
සමාජ විද්‍යා අංශය,කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRAT

යුද්ධයකදී මියයෑම් හා අතුරුදහන්වීම් වලට වඩා ආබාධිත වීම් දිගුකාලීන සමාජ, මානසික ගැටලු ඇති කරයි. මෙම තත්වය සෘජුවම සොල්දාදුවාට සේම ඔහුගේ දෙමාපියන්, බිරියන් සහ දරුවන්ට ගැටලු ඇති කරයි. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ යුද්ධයෙන් ආබාධිත තත්වයට පත්වන සොල්දාදුවන්ගේ බිරියන් මුහුණ දෙන මානසික, සමාජීය ගැටලු හඳුනා ගැනීමයි.

මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ආබාධිත සොල්දාදුවන්ගේ බිරියන් මුහුණදෙන මනෝ සමාජීය ගැටලු මොනවාද? යන්නයි. එහි අරමුණු කිහිපයකි. එනම් ආබාධිත තත්ත්වය විවාහ ජීවිතයට බලපා ඇත්තේ කෙසේද? යන්න හඳුනා ගැනීම හා බිරිඳක්, මවක්, හා සහෝදරියක් ලෙසින් මෙම ස්ත්‍රීන්ගේ භූමිකාවන්හි සිදුව ඇති වෙනස්කම් මොනවාද? යන්න හඳුනා ගැනීමයි.

මෙම පර්යේෂණය ප්‍රතිචාර දක්වන්නා පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා වැදගත් වන ගුණාත්මක දත්ත පදනම් කරගත් ගුණාත්මක පර්යේෂණයකි (Qualitative Research). ඒ සඳහා අනුගමනය කළ පර්යේෂණ ක්‍රම වන්නේ සිද්ධි අධ්‍යයන ක්‍රමය (Case Study Method) හා සන්සන්දනාත්මක ක්‍රමයයි (Comparative Method). දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් සම්මුඛසාකච්ඡා (Interview) හා නිරීක්ෂණය (Observation) යොදා ගතිමි.

එක් භූගෝලීය ප්‍රදේශයක් තුළින් නියැදිය පහසුවෙන් තෝරා ගැනීමට හැකිවීමත්, එමගින් බහුතරයකගේ අදහස් විමසීමට ඇති හැකියාවත් හේතුවෙන් අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් වතුපිටිවල රණවිරු ගම්මානය තෝරා ගතිමි. යුද්ධයේදී මියගිය, අතුරුදහන්වූ හා ආබාධිත තත්වයට පත්වූ සොල්දාදුවන්ගේ පවුල් සඳහාම වන මෙම ගම්මානයේ පවුල් 111ක් ජීවත් වන අතර පූර්ණ ආබාධිත සෙබලුන්ගේ බිරියන් 6 දෙනෙක් හා සාමාන්‍ය ආබාධිත සෙබලුන්ගේ බිරියන් 6 වශයෙන් පොකුරු නියැදියක් තෝරා ඇත. මීට අමතරව මෙම ස්ත්‍රීන්ගේ දරුවන් ද දත්ත දායකයන් වශයෙන් යොදා ගතිමි.

ස්වාමිපුරුෂයාගේ ආබාධිත තත්වය හේතුවෙන් ස්ත්‍රීන් තම විවාහ ජීවිතය තුළ ස්වාමියාගේ ලිංගික බෙලහීනතාවය හේතුවෙන් ලිංගික ගැටලු වලට මුහුණදීම මෙන්ම දරුවන් අහිමිවීම හා දරුවන් සීමා කිරීම වැනි ප්‍රජනන ගැටලු වලටද මුහුණ දෙයි. එසේම ස්වාමියා විසින් කායික, මානසික ප්‍රචණ්ඩත්වයට ලක්කිරීමද ඇතැම් අවස්ථාවන්හි හඳුනාගත හැකිය. ස්ත්‍රියගේ භූමිකාවන් සංකීර්ණ හා අර්බුධකාරී වී ඇත. රැකියා සඳහා යොමුවීමට ඇති නොහැකියාව හා සමාජයේ වෙනත් පුද්ගලයින්ගේ අයුතු බලපෑම් වලට ලක්වීම මෙම ස්ත්‍රීන්ට පොදු ගැටලුවකි. නමුත් මෙම ගැටලුවල ස්වභාවය ස්වාමිපුරුෂයාගේ ආබාධිත තත්වය මත වෙනස්වෙයි. එනම් පූර්ණ ආබාධිත තත්වයේ පසුවන සොල්දාදුවන්ගේ බිරියන් සාමාන්‍ය ආබාධිත තත්වයේ පසුවන සොල්දාදුවන්ගේ බිරියන්ට වඩා වැඩි වශයෙන් පීඩාවට පත්වෙයි.

ආබාධිත සොල්දාදුවන්ගේ බිරියන් මුහුණදෙන මනෝ සමාජීය ගැටලු අවම කිරීම සඳහා සොල්දාදුවාගේ ආබාධිත තත්වය සැළකිල්ලට ගනිමින් සුභසාධන ක්‍රියාත්මක කළ යුතු අතර, විශේෂයෙන් මෙහිදී ස්ත්‍රීන්ට තම කාර්යභාරය පිළිබඳ පූර්ව දැනුවත් කිරීම් සිදුකළ යුතුව ඇත. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පුහුණු වැඩමුළු, මූල්‍යාධාර සහ ඒ සඳහා වෙළඳපළ අවස්ථා සැළසීම මෙන්ම බිරිඳ හා ස්වාමියා වෙනුවෙන් විධිමත් පවුල් උපදේශන සේවයක් ආරම්භ කිරීම පිළිබඳ රජයේත්, රණවිරු අධිකාරීයේත් අවධානය යොමුවිය යුතුව ඇත.